Published Date: 2024.04.03

- **උපාධිධාරී ගුරුවරුන් 2320 දෙනෙකුට පත්වීම් ලබා දීමේ අවස්ථාවට එක් වෙමින් ජනපති පවසයි.**

වසර තුනකට පසු මෙම වසරේ දී 4000ක පමණ පිරිසක් ගුරු වෘත්තියට බඳවා ගැනීමට රජය කටයුතු කර ඇති බවත්, රටේ ආර්ථිකය ශක්තිමත් වීමත් සමඟ ඉදිරි වසර වන විට ගුරු පුරප්පාඩු පිරවීම වෙනුවෙන් වැඩි මුදලක් වෙන් කිරීමට කටයුතු කරන බවත් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මේ බව සඳහන් කර සිටියේ අරලියගහ මන්දිරයේ දී අද (03) පැවති බස්නාහිර පළාත් උපාධිධාරී ගුරු පත්වීම් ප්‍රදානෝත්සවය අමතමිනි.

උපාධිධාරී ගුරුවරුන් 2320කට පත්වීම් ලබා දීම මෙහිදී සිදු කෙරුණු අතර ජනාධිපතිවරයා සංකේතාත්මකව පත්වීම් ප්‍රදානයට එක් විය.
අනතුරුව පැවති උත්සව සභාව අමතමින් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කළේ චරිතවත් ගුණගරුක අනාගත පරපුරක් බිහි කිරීමේ වගකීම ගුරුවරයාට පැවරෙන බවයි.

ගෞරවණීය වෘත්තියක් වූ ගුරු වෘත්තියේ ගෞරවය කෙළසා ගැනීමට කිසිවිටෙකත් කටයුතු නොකළ යුතු බව පැවසූ ජනාධිපතිවරයා ගුරුවරුන් නිරතුරුව විෂය දැනුමෙන් යාවත්කාලීන වීමේ වැදගත්කම ද පෙන්වා දුන්නේය.

***මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා,***

ගුරුවරුන් ලෙස ඔබ බාරගන්නේ පංතිකාමරයක් නොවෙයි. ඔබ භාරගන්නේ එම පන්ති කාමරයේ සිටින සිසු සිසුවියන්ගේ අනාගතයයි. අවුරුදු 05 සිට අවුරුදු 19 වන තෙක් ශිෂ්‍ය ශිෂ්‍යාවන් කාලය ගත කරන්නේ ඔබ සමගයි. ඒ නිසා ඔවුන්ට ගෙදරින් ලැබෙන මගපෙන්වීම වගේම පාසලින් ලැබෙන මගපෙන්වීමත් ඉතා වැදගත් වෙනවා. ඒ වගකීම ඉෂ්ට කළයුත්තේ ඔබයි. ඔබට තිබෙන්නේ සිසුන්ට විෂය දැනුම ලබාදීම පමණක් නොවෙයි. මේ සිසු සිසුවියන්ගේ ජීවිතය හැඩ ගැස්වීමද සිදු කළයුත්තේ ඔබයි.

අද අන්තර්ජාලයෙන් ද විෂය දැනුම ලබාගත හැකියි. නමුත් දරුවන්ගේ චරිත ගොඩනැගීම ඒ හරහා සිදු කළ නොහැකියි. අප සියලුදෙනාගේ ජීවිත ගොඩනගා ගැනීමේදී දෙමාපියන්ගෙන් ලැබුණු මගපෙන්වීම වගේම ගුරුවරුන්ගේ ලැබුණු මගපෙන්වීමත් ඉතා වැදගත් වුණා. ගුරු වෘත්තිය ඉහළ වෘත්තියක් ලෙස සළකනු ලබන්නේ ඒ නිසයි. එම ගෞරවය ආරක්ෂා කර ගන්නා ලෙස මම ඔබ සියලුදෙනාගෙන් ඉල්ලනවා.

ඒ වගේම ගුරුවරුන් ලෙස ඔබේ දැනුම ඉතා වැදගත් වෙනවා. අද තිබෙන්නේ දිනෙන් දින දැනුම නවීකරණය වන සමාජක්. එසේ නම් ගුරුවරුන්ට තම විෂය දැනුම වැඩි කර නොගෙන කටයුතු කිරීමට අතීතයේ දී හැකි වුවත් අද එලෙස කිරීමට හැකියාවක් නැහැ. තව වසර 10කින්, 20කින් පමණ ඔබේ දැනුම ප්‍රමාණවත් ද කියා සිතා බලන්න. ඒ නිසා තමන්ගේ විෂය දැනුම ඉහළ නංවා ගැනීමට ගුරුවරුන් සෑම අවස්ථාවකම කටයුතු කළයුතුයි.

අද ගුරුවරුන් 2300ක් බඳවා ගැනීමට කටයුතු කර තිබෙනවා. තව 700කට පත්වීම් ලබාදීමට තිබෙනවා. පුරප්පාඩු අනුව තවත් ගුරුවරුන් 1000ක් පමණ බඳවා ගැනීමට සැලසුම් කර තිබෙනවා. ඒ අනුව මෙම වසරේ ගුරු වෘත්තියට 4000ක් පමණ බඳවාගෙන තිබෙනවා. වසර තුන හතරකින් පසුව තමයි මෙම බඳවා ගැනීම් සිදු කිරීමට හැකියාව ලැබුණේ. කොවිඩ් වසංගතය වගේම ආර්ථික කඩා වැටීම හමුවේ මේ සියලු බඳවා ගැනීම් නැවතී තිබුණා.

රටේ ආර්ථික වර්ධන වේගය ඍණ අගයකට පත්ව තිබුණා. නමුත් රජය ගෙන ගිය නිවැරදි ආර්ථික කළමනාකරණය හේතුවෙන් අද රුපියලේ වටිනාකම ඉහළ ගොස් තිබෙනවා. ඒ අනුව ආර්ථිකය ශක්තිමත් වී තිබෙනවා. ඒ නිසා අද මෙම බඳවා ගැනීම් සිදු කිරීමට අපට අවස්ථාව ලැබී තිබෙනවා.

පසුගිය වසරේ ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය 370ක් බවට පත්ව තිබුණා. අද වන විට ඩොලරයට සාපේක්ෂව රුපියල 300ක අගයක පවතින අතර එය ඉදිරියේදී 280ක් දක්වා පහළ ගෙන ඒමට බලාපොරොත්තු වෙනවා. එවිට ජනතාවගේ අතට ලැබෙන මුදල ශක්තිමත් වෙනවා.

අද ආණ්ඩුවේ වැඩකටයුතු සඳහා මුදල් සොයාගත යුතුව තිබෙනවා. අද අපි ගමන් කරන්නේ දුෂ්කර මාර්ගයක වුවද ඉදිරියේ දී ආර්ථික දියුණුවක් ඇති කර ගැනීමට හැකියාව ලැබෙනවා. අපට මේ කාලයේ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට මෙන්ම දීමනා වැඩි කිරීමට හැකියාව ලැබුණා. ඒ වගේම අස්වැසුම ප්‍රතිලාභ තුන් ගුණයකින් වැඩි කිරීමට මෙන්ම සිංහල අවුරුදු සමයේ වී වලට හොඳ මිලක් ලබාදීමට හැකියාව ලැබුණා. ඒ වගේම ආර්ථිකයේ ඇති වන දියුණුව සමග ලබන වසර වන විට ගුරුවරුන් බඳවා ගැනීම සඳහා මීට වඩා වැඩි මුදලක් අමාත්‍යාංශයට ලබාදීමට අප කටයුතු කරනවා.

***අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මහතා,***

මෙම පත්වීම් ලබාදිය යුතුව තිබුණේ මීට මාස 6කට පෙර බව සඳහන් කළ යුතුයි. පසුගිය වසර අවසාන වන විට පැවති ගුරු හිඟය සම්පූර්ණ කිරීමට ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව මම අමාත්‍ය මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කළා. ඒ අනුව බස්නාහිර පළාත් සභාව විසින් කඩිනමින් ගුරුවරුන් බඳවා ගැනීමට විභාගය පවත්වනු ලැබුවා. මීට අමතරව සෙසු පළාත්වල ගුරුවරුන් බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වන අවස්ථාවේ එක්තරා පිරිසක් අධිකරණයට ගියා. එම අධිකරණ ක්‍රියාමාර්ග නිසා මේ පත්වීම් ලබාදීම ප්‍රමාද වුණා.

ගුරුවරුන් බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වන්නේ විෂය සමගාමීවයි. ඔවුන්ව පුහුණු කරන්නේ ළමුන්ට නිසි අධ්‍යාපනයක් ලබාදීමටයි. මෙවැනි ක්‍රියාදාමයක් යටතේ ගුරුවරුන් බඳවා ගන්නා විට අද වන විටත් ඇතැම් පිරිස් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරමින් සිටිනවා. එම නිසා 2019 වසරේ බඳවා ගත් උපාධිධාරී සංවර්ධන නිලධාරීන් ස්ථිර කිරීමට නොහැකිව තිබෙනවා. ගුරු හිඟය පියවීමට ගුරුවරුන් බඳවා ගත යුතුයි. අද මෙලෙස බඳවා ගත් ගුරුවරුන්ට අමතරව ඉදිරියේදීත් නව පත්වීම් ලබාදීමට රජය කටයුතු කරනවා.

***බස්නාහිර පළාත් ආණ්ඩුකාර මාර්ෂල් ඔෆ් ද එයාර් ෆෝස් රොෂාන් ගුණතිලක මහතා,***

බස්නාහිර පළාතට අද සතුටුදායක දිනයක්. ගුරු හිඟය දීර්ඝ කාලයක් තිස්සේ පැවති ප්‍රශ්නයක්. මෙම බඳවා ගැනීම් නිසියාකාරව සිදු කළ යුතුයි. පසුගිය කාලයේ පැවති අභියෝග නිසා ගුරුවරුන් බඳවා ගැනීම් ප්‍රමාද වුණා. පාසල්වල ගුරු පුරප්පාඩු ක්‍රම ක්‍රමයෙන් ඉහළ ගියා. රටකට, අධ්‍යාපනයට ගුරු හිඟය දරාගන්න බැහැ. එබැවින් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගුරුවරුන් බඳවා ගැනීමට අනුමැතිය ලබාදීම සම්බන්ධව ස්තුතිය පුදකර සිටිනවා. ඒ වගේම අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

අද මෙම ගුරු පත්වීම ලබා ගන්නා ඔබ සිදු කරන්නේ රැකියාවක් පමණක් නොවෙයි. රටට සේවයක් කිරීමටද ඔබ බැඳී සිටිනවා. දරුවන්ගේ දෙවැනි මගපෙන්වන්නා වන්නේ ගුරුවරුන් බව සිහියේ තබාගත යුතුයි. ගුරුවරු වශයෙන් ඔබ දරුවන්ට ආදර්ශයක් විය යුතුයි.

අමාත්‍ය නලින් ප්‍රනාන්දු, රාජ්‍ය අමාත්‍යවරුන් වන ලසන්ත අලගියවන්න, සිසිර ජයකොඩි, අරවින්ද කුමාර් යන මහත්වරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ද, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ප්‍රදීප් යසරත්න, අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් තිලකා ජයසුන්දර, බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ධම්මිකා විජයසිංහ යන මහත්ම මහත්මීන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

PLUSINFO.LK